ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2017 ඔක්තෝබර් 16 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණය - 2017 සැප්තැම්බර්

- **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** 2017 සැප්තැම්බර් මාසයේ දී 59.0 ක දර්ශක අගයක් වාර්තා කරන ලද අතර, එය 2017 අගෝස්තු මාසයට සාපේක්ෂව දර්ශක අගයයන් 4.6 ක වර්ධනයකි. ඒ අනුව, 2017 අගෝස්තු මාසයට සාපේක්ෂව සැප්තැම්බර් මාසයේ දී නිෂ්පාදන කටයුතු ඉහළ වේගයකින් වර්ධනය වීමක් පිළිඹිබු වේ. මෙම ඉහළ යෑම සඳහා, පසුගිය මාසයේ පහත වැටුණු සේවා නියුක්තිකයන්ගේ උප දර්ශකය, නව ශ්‍රමිකයන් බඳවා ගැනීම හේතුවෙන් යථා තත්ත්වයට පත්වීම විශේෂයෙන්ම හේතු විය. තවද, 2017 සැප්තැම්බර් මාසයේ දී නිෂ්පාදන සහ නව ඇණවුම් යන උප දර්ශක ඉහළ වේගයකින් වර්ධනය විය. පසුගිය මාසයේ දී දක්නට ලැබුණු තොග අතිරික්තය හේතුවෙන්, මෙම මාසයේ දී ගැනුම් තොග උප දර්ශකය අඩු වේගයකින් වර්ධනය විය. ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උප දර්ශකය, පසුගිය මාසයට සාපේක්ෂව අඩු වේගයකින් වර්ධනය විය. සියලුම උප දර්ශක කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කරන ලදී. තවද, ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් යහපත් අගයක් වාර්තා කරයි.

- **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** 2017 අගෝස්තු මාසයේ දී වාර්තා වූ 60.1 ක දර්ශක අගයට සාපේක්ෂව සැප්තැම්බර් මාසයේ දී 57.0 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී. 2017 අගෝස්තු මාසයට සාපේක්ෂව සැප්තැම්බර් මාසයේ දී සේවා අංශය අඩු වේගයකින් වර්ධනය වූ බව මෙමගින් පෙන්නුම් කෙරෙයි. සේවා නියුක්තිය සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් උප දර්ශක 2017 අගෝස්තු මාසයට සාපේක්ෂව සැප්තැම්බර් මාසයේ දී සුළු වශයෙන් වර්ධනය විය. ව්‍යාපාර ක්‍රියාකාරකම් උප දර්ශකය සැලකිය යුතු ලෙස පහළ ගිය නමුත් 50 සීමාවට ඉහළින් පැවතුණි. 2017 අගෝස්තු මාසයට සාපේක්ෂව සැප්තැම්බර් මාසයේ දී නව ව්‍යාපාර අඩු වේගයකින් වර්ධනය වූ අතර නිම කිරීමට ඇති කාර්යයන් පහළ යන ලදී. කාලගුණික ප්‍රවණතා හේතුවෙන් නවාතැන් සහ ආහාරපාන සැපයීමේ අංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම්වල පහළ යෑමක් වාර්තා විය. මේ අතර, අන්තර්ජාල භාවිතය මත පනවා තිබූ බදු ඉවත් කිරීමත් සමග සන්නිවේදන අංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම්වල වර්ධනයක් අපේක්ෂා කෙරේ. අය කරන මිල ගණන් සැලකීමේදී එය 2017 අගෝස්තු මාසයට සාපේක්ෂව සැප්තැම්බර් මාසයේ දී අඩු වේගයකින් ඉහළ ගියේය. ප්‍රසාද දීමනා සහ උත්සව අත්තිකාරම් වැනි සෑතුමය ප්‍රතිලාභ හේතුවෙන් 2017 සැප්තැම්බර් මාසයේ දී අපේක්ෂිත ශ්‍රම පිරිවැය උප දර්ශකය සුළු වශයෙන් ඉහළ ගියේය.

| | වසර | ජන. | පෙබ. | මාර්. | අප්‍රේ. | මැයි | ජූනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **2015** | n.a. | n.a. | n.a. | n.a. | 67.3 | 57.5 | 55.5 | 56.5 | 53.2 | 57.8 | 54.8 | 57.9 |
| | **2016** | 51.9 | 55.3 | 60.7 | 41.6 | 47.9 | 55.1 | 50.6 | 53.5 | 57.7 | 56.5 | 58.4 | 58.3 |
| | **2017** | 56.2 | 57.1 | 66.5 | 41.8 | 57.9 | 56.1 | 54.3 | 54.4 | 59.0 | - | - | - |
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **2015** | n.a. | n.a. | n.a. | n.a. | 66.8 | 65.0 | 60.6 | 59.8 | 61.7 | 59.5 | 59.3 | 60.2 |
| | **2016** | 58.0 | 59.3 | 61.6 | 54.7 | 58.1 | 56.3 | 57.8 | 61.2 | 57.7 | 59.3 | 59.7 | 59.8 |
| | **2017** | 57.5 | 57.3 | 60.8 | 54.2 | 55.3 | 59.2 | 59.1 | 60.1 | 57.0 | - | - | - |

## නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




## සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය



තාක්ෂණික සටහන:

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍යය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.